---

**හබරාදුව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හබරාදුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වත්කම් බැරකම් බෙදාදීම් කමිටුවේ නිර්දේශ මත හබරාදුව ප්‍රාදේශීය සභාව විසින් ඉමදුව ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු ලෙසට තීරණය කර තිබූ රු.15,867,478 ක වත්කම් හා රු.2,051,705 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, විගණන දිනය වූ 2013 ජුලි 23 දින වනවිටත් අදාළ වත්කම් හා වගකීම් ගැසට් නිවේදනයක් මඟින් නීත්‍යානුකූලව ඉමදුව ප්‍රාදේශීය සභාව වෙත පවරා දී නොතිබුණි.

(ආ) සභා අරමුදලින් ඉටු කිරීමට අපේක්ෂිත රු.1,790,300 ක් වූ කර්මාන්ත 04 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මූලධන ආධාර ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් රු.1,790,300 කින් මූලධන ආධාර හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.28,941,214 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.15,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමුච්චිත අරමුදල රු.13,941,214 කින් අඩුවෙන් ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.34,724,401 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.20,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.14,724,401 කින් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබුණු රු.5,611,851 ක් වූ දායක මුදල් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා වීථි පහන් නඩත්තුව වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතුව තිබුණු රු.96,840 ක මුදල සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් සභාවට ලබා දී තිබූ රු.140,000 ක් වටිනා ඖෂධ තොගය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.93,115,831 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,475,818 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,288,479 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 5,450 | 4,951 | 5,014 |
| (ii) | බදු කුලී | 26,966 | 3,097 | 245 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,128 | 631 | 34 |
| (iv) | වෙනත් ආදායම් | 70,915 | 33,125 | 30,104 |

### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගත යුතුව තිබූ රු.5,013,854 ක් වූ වරිපනම් හා බදු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 225,000 |
| (ii) | මුද්දර ගාස්තු | 57,303,380 |

**2.2.4 සංචාරක ව්‍යාපාරවලින් 1% බදු අයවීම්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තියේ දක්වා ඇති පරිදි 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර තිබූ හෝටල් හා ලැගුම්හල් 21 කින් 2012 වර්ෂය තුළ 1% ගාස්තු අය කරගෙන නොතිබුණි.

**2.2.5 කඩ කාමර බදු දීම**

සභාව සතු කඩ කාමර බදුදීම පිළිබඳව 2013 මාර්තු 19 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පැරණි පොදු වෙළඳපොල කඩ කාමර 07 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) නව වෙළඳ සංකීර්ණයේ පහල මාලයේ කඩ කාමර 02 ක් සහ උඩු මහලේ කඩ කාමර 01 ක් අතුරු බදු දී තිබුණි.

(ඇ) බිම් මහලේ අංක 01, 03, 07, 09, 11, 12, 14, 15 කඩ කාමර ඉදිරිපිට භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබුණි.

(ඈ) බිම් මහලේ කඩ කාමර අංක 01, 03 හා 09 සම්බන්ධයෙන් බදු ගිවිසුම් අළුත් කර නොතිබුණි.

**2.3 අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.6,692 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2012 වර්ෂයේ නව සභාව පත්වීමෙන් පසු, විගණන දිනය වූ 2013 මාර්තු 21 දින දක්වා සභාවේ කිසිදු මන්ත්‍රීවරයකු වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**(ආ)** සභාවේ සේවයේ යෙදී සිටි සේවකයින් 08 දෙනෙකුගෙන් රු.26,850 ක ණය ශේෂයක් අයවීම් හිඟහිටව පැවති අතර, ඉන් රු.17,100 ක් 2010 වර්ෂයේ සිට ද රු.9,750 ක් 2011 වර්ෂයේ සිට ද නොගෙවා හිඟහිටව පවතින බව නිරීක්ෂණය විය.

**(ඇ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයට අනුව සභාව සතු පුස්තකාලවල තිබූ රු.105,025 ක් වටිනා පොත් 580 ක් අස්ථානගත වී තිබුණ ද, ඒ සම්බන්ධව වගකිවයුතු පුද්ගලයින්ගෙන් පොත්වල වටිනාකම් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සභාව විසින් සිදුකර නොතිබුණි.

**(ඈ)** 2012 වර්ෂය වෙනුවෙන් වීථි පහන් නඩත්තුව සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතුව තිබූ රු.98,600 ක මුදල විගණන දිනය වූ 2013 මාර්තු 21 දින දක්වාම අය කරගෙන නොතිබුණි.

**(ඉ)** 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ඊ)** 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.5 ඉඩම් වෙන්දේසි

------------------

### (අ) සන්ෂයින් පාක්

-----------------

හබරාදුව හරුමල්ගොඩ පිහිටි හෙක්ටරයාර් 1.82262 ක් වූ ඉඩම පිඹුරුපත් අංක : 303/1999 මගින් කැබලි 59 කට බෙදා වෙන්කර, සන්ෂයින් පාක් නමින් 1999 අගෝස්තු 04 දින කැබලි සැලැස්ම අනුමත කර තිබුණි.

මේ පිළිබඳව 2013 මාර්තු 15 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති විසින් 1992 සැප්තැම්බර් 30 දින නිකුත් කර තිබුණු අංක:3/2/1/10(ii) දරන චක්‍රලේඛය අනුව හෙක්ටයාර් 1 ට වැඩි සෑම අනු බෙදුමකින්ම වීථි අත්හැරීමෙන් පසු ඉඩමේ ප්‍රමාණයෙන් 10% ක් පොදු කටයුතු සඳහා සුදුසු මෙන්ම යෝග්‍යතම ස්ථානයකින් සභාවට ලබා දියයුතු බව දක්වා ඇත. ඉහත වෙන්දේසියට අදාල හෙක්ටයාර් 1.82262 ක් වූ ඉඩමෙන් 10% ක ඉඩම් කැබල්ලක් සභාවට ලබා දීමේ දී වීථිවලට අයත් ඉඩම් ප්‍රමාණය අත්හැර හෙක්ටයාර් 1.49484 කින් සභාවට දියයුතු ප්‍රමාණය හෙක්ටයාර් 0.149484 ක් වුවද, සභාවට ලබා දී තිබුණු ප්‍රමාණය හෙක්ටයාර් 0.04039 ක් පමණි. මේ අනුව සභාව විසින් හෙක්ටයාර් 0.109094 ක් අඩුවෙන් ලබා ගෙන තිබුණි.

(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බලප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් වෙන්දේසිවලින්, එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක බද්දක් විකුණුම්කරු විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. සියලුම ඉඩම් කැබලි විකිණී තිබුණද , 1% බදු ගෙවා නොතිබුණි.

(iii) කැබලි 59 කින් යුත් ඉහත ඉඩමෙන් සභාවට ලබා දී තිබූ හෙක්ටයාර් 0.04039 ක ප්‍රමාණයට ඇතුළත් අංක 04 හා 54 ඉඩම් කැබලිවලට අදාල ඔප්පු 2013 මාර්තු මාසය දක්වාත් සභාවට ලබාගෙන නොතිබුණි.

**(ආ) හෙරිටේජ් පාක්**

-------------------

හබරාදුව හරුමල්ගොඩ පිහිටි හෙක්ටයාර් 2.0108 ක් වූ ඉඩම කැබලි 67 ක් කොටස් කර, ඉන් කැබලි 59 ක් පදිංචිය සඳහා නිවාස ඉදිකිරීමට කැබලි සැලැස්ම 2012 මාර්තු 27 දින සභාව විසින් අනුමත කර තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩමෙන් සභාවට ලබා දී තිබූ පර්චස් 66.72 ක බිම් කොටස් 06 ට අදාල ඔප්පු විගණන දිනය වූ 2013 මාර්තු 15 දින දක්වාම සභාව විසින් ලබාගෙන නොතිබුණි.

**2.6 අභ්‍යන්තර විගණනය**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**03. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය